# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT 2019



Art by-Ishani Prarthana Hettiarachchi
Maharagama

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය.
மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக் கல்வி, அறநெறிப் பாடசாலைகள் கல்விச் சேவைகள் மற்றும் பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சு
**State Ministry of Women and Child Development, Pre – School & Primary Education, School Infrastructure & Education Services**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

# වාර්ෂික වාර්තාව

# 2019

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක්
ගොඩනැගීම

## මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව
තහවුරු කිරීම

# 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| නීතිඥ එච්. එම්. අබයරත්න මහතා<br>(2018 - 2019 ) | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,<br>ශ්‍රී ජයවර්ධනපුර. |
| නීතිඥ සුජාතා කුලතුංග මහත්මිය<br>(2018 - 2019) | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,<br>අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,<br>ශ්‍රී ජයවර්ධනපුර. |
| මහාචාර්ය අශ්විනි ප්‍රනාන්දු මහත්මිය<br>(2018 - 2019) | ජ්‍යෙෂ්ඨ ළමා රෝග විශේෂඥ,<br>මූලික රෝහල,<br>රාගම. |
| වෛද්‍ය අපේක්ෂා හේවාගීගන මහත්මිය<br>(2018 - 2019) | මනෝ වෛද්‍ය විශේෂඥ,<br>රිජ්වේ ආර්යා ළමා රෝහල,<br>බොරැල්ල. |
| වෛද්‍ය යූ.ඒ.කේ. තෙන්නකෝන් මහතා<br>(2018 - 2019) | ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී,<br>විෂවේදය හා නීති වෛද්‍ය ආයතනය,<br>බොරැල්ල,<br>කොළඹ 08. |
| නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය<br>(2018 - 2019) | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්<br>නීතිපති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 12. |
| වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය මහත්මිය<br>(2018 - 2019) | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය විශේෂඥ,<br>පවුල් සෞඛ්‍ය කාර්යාංශය,<br>කොළඹ 08. |
| එම්. ආර්. ලතීෆ් මහතා<br>(2017 - 2019) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>විශේෂ කාර්යබලකා මූලස්ථානය,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. |
| චන්ද්‍රිමා සිගේරා මහත්මිය | කොමසාරිස්,<br>පරිවාස හා ළමාරක්ෂක සේවා<br>දෙපාර්තමේන්තුව,<br>II වන අදියර, සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| ඒ. විමලවීර මහතා<br>(2017 - 2020) | කම්කරු කොමසාරිස් ජනරාල්,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කිරුල පාර,<br>කොළඹ 05. |

| | |
|---|---|
| සුජීවා පල්ලියගුරු මහත්මිය<br>(2018 සිට වර්තමානය දක්වා) | අධ්‍යක්ෂ - සංවර්ධන,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>II වන අදියර, සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| ආර්.එම්.ඒ. රත්නායක මහතා<br>(2016 - 2019) | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව,<br>මුදල් අමාත්‍යාංශය,<br>කොළඹ 01. |
| ඒ. එස්. බී. බක්මීවැව මහතා<br>(2018 - 2019) | ජ්‍යෙෂ්ඨ පුහුණු උපදේශක,<br>සාමාජික<br>අංක 138, පින්වලපිටිය වත්ත<br>කුරුණෑගල |
| ඒ.ආර්.පී.සී. උදයකුමාර අමරසිංහ මහතා<br>(2018 ) | අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| එන්.ආර්.අනීස් මෙනවිය<br>(2019 - 2020) | අධ්‍යක්ෂ ජනරාල්,සංවර්ධන මූල්‍ය<br>දෙපාර්තමේන්තුව,<br>මුදල් අමාත්‍යාංශය,<br>කොළඹ 01. |

## 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| | |
|---|---|
| කේ. එච්. රෝෂිණී මහත්මිය<br>(2017 - 2019) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>අධිකරණ අමාත්‍යාංශය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය,<br>අධිකරණ මාවත<br>කොළඹ 01. |
| ආචාර්ය මධුරා එම්. වෙහැල්ල මහත්මිය<br>(2017 - 2019) | අතිරේක ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |
| ඩබ්ලිව්. ඒ. කුලසූරිය මහතා<br>(2017 - 2019) | අතිරේක ලේකම්,<br>රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,<br>බාලදක්ෂ මාවත,<br>කොළඹ 03. |
| පී.ජේ.ඩී. ප්‍රනාන්දු මහත්මිය<br>(2016 - 2020) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය,<br>සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| ඒ. එච්. එල්. ඩී. සොයිසා මහතා<br>(2017 - 2019) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය,<br>අංක 330, යුනියන් පෙදෙස,<br>කොළඹ 02. |
| ආර්.එල්.එස්.පී. ස්වර්ණලතා මහත්මිය<br>(2018 - 2019) | අතිරේක ලේකම්,<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,<br>II වන අදියර, සෙත්සිරිපාය,<br>බත්තරමුල්ල. |
| සී.එච්. ගමගේ මහතා<br>(2019 - 2020) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>සංචාරක අමාත්‍යාංශය,<br>යෝර්ක් වීදිය,<br>කොළඹ 01. |

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 1 |
| ප්‍රධාන කාර්යභාරය | 2 - 3 |
| අධිකාරියේ ව්‍යුහය | 3 - 4 |
| 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය. | 5 |
| 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු | 6 - 8 |
| **ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2019** | |
| ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 8 |
| ශ්‍රී ලංකාවේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සහ ප්‍රමිති සංග්‍රහය | 9 |
| පාසල් විෂය මාලාවට ජීවන නිපුණතා සංවර්ධනයට සහ ලිංගික අධ්‍යාපනයට අදාළ කරුණු ඇතුළත් කිරීම | 9 |
| හදිසි ආපදා තත්ත්වයක දී පිළිපැදිය යුතු වන මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත සකස් කිරීම (දරුවන් සඳහා මානසික ප්‍රථමාධාර) | 10 |
| සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාව සඳහා පුහුණුකරුවන්ගේ මාර්ගෝපදේශය | 10 |
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම | 11 |
| 2011/17 අධ්‍යාපන චක්‍රලේඛය යාවත්කාලීන කිරීම | 11 |
| පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන | 12 |
| ''ජනපවුර'' ප්‍රජා පාදක ළමා ආරක්ෂක වැඩසටහන | 12 - 13 |
| වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිත ළමුන් සහ ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන | 13 |
| ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂක ව්‍යාපෘතිය (සියපත් සුරැකුම්) | 14 |
| අඩු වයසේ ගැබ්ගැනීම් වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 14 |
| ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් පාසල් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම | 14 |
| දෙමාපියන් හා ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත (ශික්ෂා) | 15 |
| ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා අධ්‍යාපන කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන. | 15 - 16 |

| | |
|---|---|
| විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 16 |
| ළමා ආරක්ෂාව පිළිබඳව පොලිස් අභ්‍යාස විද්‍යාලවල නිලධාරීන් දැනුවත් කිරීම | 16 |
| ළමා ආරක්ෂාව පිළිබඳ සෞඛ්‍ය වෘත්තිකයන් හා ස්වෙච්ඡා සෞඛ්‍ය සේවකයන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන | 16 - 17 |
| ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 17 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පාලන අධිකාරිය සහ කාර්යමණ්ඩලය සඳහා පුහුණුව | 17 |
| රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල ළමයින් සහ කාර්ය මණ්ඩලය සඳහා මනෝසමාජීය පුහුණුව | 17-18 |
| පාසල් උපදේශන ගුරුවරුන් සඳහා මනෝසමාජීය පුහුණුව | 18 |
| විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන | 18 |
| මුද්‍රිත මෙවලම් නිර්මාණය කිරීම | 19 |
| ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය සමාජ වැඩසටහන | 19 |
| ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය | 19 |
| ලෝක ළමා දිනය | 20 |
| ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය | 20 |
| ප්‍රදර්ශන සහ ජංගම සේවා | 20 |
| සුනාමි කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩල | 20 - 21 |
| මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබාදීම | 21 |
| වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජීය සහය ලබාදීම (දිරිය වැඩසටහන) | 21 |
| ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) නියාමනය කිරීමේ වැඩසටහන | 21 - 22 |
| මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 22 |
| දිස්ත්‍රික් නිලධාරීන් සඳහා කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 22 |
| සැලසුම්කරණය, අධීක්ෂණය සහ ඇගයුම් වැඩමුළු | 22 |
| වීදි ළමුන් සහ යාචකයන් පිළිබඳ අධ්‍යයනය | 23 |
| දිස්ත්‍රික් පාර්ශවකරුවන්ගේ රැස්වීම් | 23 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ තොරතුරු වෙබ් අඩවිය සංවර්ධනය කිරීම | 23 |

| | |
|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම. | 24 |
| ජනමාධ්‍ය සම්බන්ධීකරණය | 24 |
| ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම | 24 |
| 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව | 24 - 25 |
| ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි | 25 - 27 |
| නීතිමය කර්තව්‍යයන් | 27 - 28 |
| විශේෂ පොලිස් විමර්ශන | 28 - 29 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා 2019 වර්ෂය තුළ පැවැත්වූ පුහුණු වැඩමුළු | 29 - 30 |
| 2019.12.31 දිනට ආදායම් ප්‍රකාශය | 31 |
| 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 32 |
| 2019.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 33 - 34 |
| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 35 |
| විගණන වාර්තා | 36 - 43 |

## හැඳින්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය අතර ප්‍රධාන වන්නේ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමයි. මෙම වසර තුළ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදි.

1989 නොවැම්බර් 20 වන දින "එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විශ්ව ප්‍රකාශනයක්" ලෙස සම්මත කර ගන්නා ලදී. මෙම ප්‍රඥප්තිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමි විය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් එකල පැවති සමාජ තත්ත්වය විමසා බැලීමේදී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම අරමුණු විය. එහිදී ජාත්‍යන්තර වශයෙන් පැවති රහස් වෙළඳාම ඉහළ යාම දැඩි ලෙස සැලකිලිමත් වෙමින් ද, ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දක්වා ඇත. වර්ෂ 2000 දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ට, ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම යන අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ලොව පැවති මෙම ප්‍රවණතාවයත් සමඟ ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදි. 1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඒ අනුව1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. 1998 නොවැම්බර් මාසයේදී මෙම පනත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මතවිය.ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1990 ජූනි මාසයේදී අධිකාරියේ සභාපති හා පාලක සභාව පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට ම වර්තමානය දක්වා ම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින්ද අධිකාරිය වෙත බලතල හිමි ව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදු කළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින "1929" ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමග සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලු ම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන වාර්තා වන අතර, උපදේශන සේවාවන් ද මෙමගින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් මෙම වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළකාර්යයන් සිදු කර ඇත.

## ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්ය භාරයක් පැවරී ඇත.

- ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- එවැනි අපයෝජන වලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම.
- අපයෝජන වලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජන වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථා වල දි එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිසා හා ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
- ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
- සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
- ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
- සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව යොමු වීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුලුකර ගැනීම.

- අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
- ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරින් වෙත යොමු කිරීම.
- ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත්සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහය වීම.
- ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වා ගෙන යාම.
- අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුන්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.
- ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම.
- ළමා අපයෝජන වලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමග සංවාදයෙහි යෙදීම.
- ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.
- සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ ආණ්ඩු සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

## අධිකාරියේ ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත ඒකක ක්‍රියාත්මක වේ.


- පරිපාලන හා මානව සම්පත් අංශය
- මූල්‍ය අංශය
- සැලසුම් හා තොරතුරු අංශය
    - සැලසුම් හා නියාමන ඒකකය
    - මාධ්‍ය තොරතුරු හා ඒකකය
        - පුස්තකාලය
- වැඩසටහන් අංශය
- මනෝසමාජීය අංශය

- නීති අංශය
    - වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
- නීතිය බලාත්මක කිරීමේ අංශය
    - 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය

   - විමර්ශන ඒකකය
   - මධ්‍යම ලේඛනාගාරය
   - විමර්ශන හා සයිබර් ආවේක්ෂණ ඒකකය

- අභ්‍යන්තර විගණන අංශය
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය

## 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය



## 2019 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලය සහ සේවයේ නියුතු කාර්යමණ්ඩලය සහ පුරප්පාඩු

| අංකය | තනතුර | වැටුප්- කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජෙනරාල් | HM -2-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් | HM -1-3 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | - | 01 |
| 05 | අධ්‍යක්ෂ - නීති | HM -1-1 | 01 | - | 01 |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | - | 01 |
| 07 | අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාක්මක කිරීම | HM -1-1 | 01 | - | 01 |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ - නීති | MM -1-1 | 01 | 01 | - |
| 12 | සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් | MM -1-1 | 01 | 01 | - |
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා | MM -1-1 | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු හා මාධ්‍ය | MM -1-1 | 01 | - | 01 |
| 16 | සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | - | 01 |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 | - |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 | 01 | - |
| 20 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 21 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 22 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 23 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 24 | තොරතුරු හා මාධ්‍ය නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 26 | පර්යේෂණ හා සුහසාධන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 27 | පරිවර්තක (ඉංග්‍රිසි) | MA - 4 | 01 | - | 01 |
| 28 | පරිවර්තක (දමිළ) | MA - 4 | 01 | - | 01 |
| 29 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 | 18 | 07 |
| 30 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 | 14 | 11 |
| 31 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 360 | 248 | 112 |
| 32 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 | - |
| 33 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 02 | 01 |
| 34 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 35 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | - | 01 |
| 36 | සැලසුම් සහකාර | MA - 3 | 01 | 01 | - |
| 37 | නීති සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 38 | විමර්ශන සහකාර | MA - 3 | 02 | - | 02 |
| 39 | උපදේශන සහකාර | MA - 3 | 04 | 03 | 01 |
| 40 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 41 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 01 | 01 | - |
| 42 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 01 | - | 01 |
| 43 | චිකිත්සක | MA - 3 | 03 | 01 | 02 |
| 44 | වීඩියෝ තාක්ෂණ සහකාර | MA – 2-1 | 01 | 01 | - |
| 45 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 | 09 | 06 |
| 46 | තොරතුරු තාක්ෂණ සහකාර | MA – 2-1 | 02 | 02 | - |
| 47 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 | 28 | 04 |
| 48 | රියදුරු | PL-3 | 07 | 06 | 01 |
| 49 | පණිවිඩකරු | PL-1 | 01 | - | 01 |
| 50 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 02 | 01 |
| 51 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 | 01 |
| **මුළු සංඛ්‍යාව** | | | **527** | **359** | **168** |

# ක්‍රියාත්මක කළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2019


## ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යක් වේ. ඒ සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක පනතේ (අ) වගන්තිය මගින් බලය පවරා ඇත. ඒ අනුව මේ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රත්පත්තිය සකස් කිරීම සඳහා 2009 වසරේ සිටම කටයුතු කර ඇත. 2016 සහ 2017 වර්ෂයන්වල දී මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලදී. 2019 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මූල මණ්ඩලයේ අවසන් එකගතාවය සහ අනුමැතිය ලබාගෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කළ අතර, 2019.10.29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා වට 2ක් පවත්වා ඇත.

## ශ්‍රී ලංකාවේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සහ ප්‍රමිති සංග්‍රහය

ශ්‍රී ලංකාව තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ජීවත්වන ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීම අතිශයින්ම වැදගත් වේ. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශ සහ ප්‍රමිති සංග්‍රහයක් සකස් කිරීම සිදු කර ඇත. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ, ජාතික මට්ටමින් සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයකම ගුණාත්මක බව සහ ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම, ආරක්ෂිත හා ළමා හිතකාමී ළමා සංවර්ධන මධ්‍යස්ථාන සේවාවක් ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සියලු ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිතව සේවය කරනු ලබන කාර්යය මණ්ඩලයන් හි සේවයේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීමයි. 2019 වර්ෂයේදී මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිති සංග්‍රහයේ අවසන් කෙටුම්පත සඳහා රේඛීය අමාත්‍යාංශයේ කමිටුවකින් අවසන් නිර්දේශ ලබාගෙන ඇත.






## පාසල් විෂය මාලාවට ජීවන නිපුණතා සංවර්ධනයට සහ ලිංගික අධ්‍යාපනයට අදාළ කරුණු ඇතුළත් කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රාථමික අංශයේ විෂය නිර්දේශයට ජීවන නිපුණතා සංවර්ධනය සහ ලිංගික අධ්‍යාපනයට අදාළ කරුණු ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය සහය ලබා දෙන ලදී. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ස්වකීය සිරුර හඳුනාගැනීම, ආරක්ෂා කර ගැනීම සහ පෞරුෂ සංවර්ධනයට අදාළ කරුණු සම්බන්ධයෙන් පාසල් සිසුන්, ගුරුවරුන් සහ නිලධාරීන් තුළ පුළුල් අවබෝධයක් ඇති කිරීම සහ ළමා ආරක්ෂාව සහ ළමා අයිතිවාසිකම් තහවුරු වන සුරක්ෂිත ළමා හිතකාමී පාසල් පරිසරයක් ඇති කිරීමයි.මේ යටතේ ප්‍රාථමික අංශයේ ගුරු උපදේශකවරුන්ගේ ගුරු පුහුණු කටයුතුවලදී භාවිත කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක වශයෙන් නිර්මාණය කරන ලද වීඩියෝ පට 3 හි පිටපත් 2019 වර්ෂය තුළ මුද්‍රණය කරන ලදී.


## හදිසි ආපදා තත්ත්වයක දී පිළිපැදිය යුතු වන මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත සකස් කිරීම (දරුවන් සඳහා මානසික ප්‍රථමාධාර)

ශ්‍රී ලංකාව තුළ ඇතිවන ජල ගැලීම්, සුලිසුළං, නායයෑම් සහ සුනාමි තත්ත්වයන් වැනි ආපදාවක දී ළමයින් දැඩි අපහසුතාවයන්ට මුහුණ දෙයි. එහි දී ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි අවධානයකින් කටයුතු කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජීය ඒකකය විසින් මෙම අත්පොත සකස් කර ඇත. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ආපදාවකට ලක් වූ ළමුන්ගේ මානසික සෞඛ්‍ය හා මනෝසමාජීය යහපැවැත්ම ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම, ආපදාවට ලක් වූ ළමුන් තුළ පවතින මානසික ගැටලුකාරී තත්ත්ව සඳහා අවශ්‍ය ප්‍රතිකාර තත්ත්ව හඳුනාගැනීම, හා මනෝසමාජීය සම්බන්ධීකරණයන් සිදු කිරීම, ළමුන්ගේ මානසික සෞඛ්‍ය හා මානසික ප්‍රථමාධාර සම්බන්ධ වෘත්තිකයන් සතු දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම, ළමා ආරක්ෂාව, ළමා අපයෝජන සහ අපයෝජනවලින් ආරක්ෂා වීම පිළිබඳ මූලික අවබෝධයක් ළමුන්ට සහ ප්‍රජාවට ලබාදීම සහ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන හෝ ස්වෙච්ඡා සංවිධානවලට විධිමත් මඟපෙන්වීමක් ලබාදීමයි. 2019 වසරේදී මෙම අත්පොත මුද්‍රණය කරන ලදී.











## සාමාන්‍ය ළමා සුරැකුම් පාඨමාලාව සඳහා පුහුණුකරුවන්ගේ මාර්ගෝපදේශය

ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානවලට අදාළ ජාතික මාර්ගෝපදේශයට සමගාමීව ළමා සුරැකුම් සහතික පත්‍ර පාඨමාලාව (NVQ ) Level 4) සකස් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) දිස්ත්‍රික් 5 ක් තුළ (කොළඹ, කළුතර, මහනුවර, ගාල්ල සහ කිලිනොච්චිය) මෙය සිදු කරයි. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි මෙම පාඨමාලාව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. මෙම පාඨමාලාව මොඩියුල් 12න් සමන්විත වන අතර ඒ සඳහා පුහුණු අත්පොතක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකස් කර ඇත. 2019 වසරේදී මෙම අත්පොතේ පිටපත් 500 ක් මුද්‍රණය කර ඇත.







## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම

ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය,ළමා ලේකම් කාර්යාලය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මූලිකත්වය ගනිමින් කටයුතු කර,ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථාන මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කරන ලදි. මෙහි අරමුණු ලෙස ජාතික මට්ටමින් සෑම ළමා දිවාසුරැකුම් මධ්‍යස්ථානයකම ගුණාත්මක බව හා ප්‍රමිතිගත ක්‍රියාවලිය සහතික කිරීම සහ වෘත්තීමය සහ ආරක්ෂිත ළමා දිවාසුරැකුම් සේවාව ප්‍රවර්ධනය කිරීමයි. 2017 වසරේදී මේ සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇත. 2019 වසරේ මෙහි සිංහල මාධ්‍ය පිටපත් 3,500 ක්, දමිල මාධ්‍ය පිටපත් 1,000 ක් ඉංග්‍රීසි පිටපත් 500 ක් සහ සී.ඩී තැටි 5,000 ක් මුද්‍රණය කරන ලදි. දිස්ත්‍රික්ක 07 ක එක් දින දැනුවත් කිරීමේ වැඩසටහන් 07ක් පවත්වන ලද අතර ඒ යටතේ රාජ්‍ය නිලධාරීන් 415 දෙනෙකු දැනුවත් කරන ලදී.








## 2011/17 අධ්‍යාපන චක්‍රලේඛය යාවත්කාලීන කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරනු ලබන පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටු වීම සඳහා 2011 අංක 17 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛනය නිකුත් කරන ලදී. මේ අනුව දීප ව්‍යාප්තව පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම, රෙගුලාසිගත කිරීම මෙම චක්‍රල්ඛයෙන් සිදු කරන ලදී. මෙම චක්‍රලේඛය වඩාත් විධිමත් ලෙස සකස් කිරීමට කටයුතු සිදු කර ඇත. මෙමඟින් අපේක්ෂිත අරමුණු වන්නේ පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමට හා සක්‍රීය කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම ගොඩනැඟීමටයි. 2019 වසරේ දී මෙම චක්‍රලේඛය යාවත්කාලීන කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක

අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන්ගෙන් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් අදහස් ලබා ගන්නා ලදී. එහිදී මෙම චක්‍රලේඛය යාවත්කාලීන සිදු නොකර, පාසල් ළමා ආරක්ෂක කමිටු අත්පොත සඳහා නව ප්‍රවණතාවයන් ඇතුළත් කර සකස් කිරීමට යෝජනා විය.

## පාසල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරන ලද ප්‍රධාන වැඩසටහනක් ලෙස පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හැඳින්විය හැකි ය. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ, පාසලට පැමිණෙන සෑම ළමයෙකුම සියලූ ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමේ වටපිටාවක් පාසල් පරිසරයේ සහ පෝෂක ප්‍රාදේශයේ ගොඩ නැගීම, පාසල් ළමා හිතකාමී පරිසරයක් බවට පත් කිරීම, ළමුන්, දෙමාපියන් සහ ගුරුවරුන් අතර සම්බන්ධය ඉහළ නැංවීම, ළමා අපයෝජන හේතු කොට වින්දිත, අනාරක්ෂිත හා ආන්තික ළමයින් හඳුනාගැනීම සහ පහසුකරණය සිදු කිරීම සහ ළමා සහභාගීත්වය වර්ධනය කිරීමයි.2019 වසරේදී අත්පොතේ කෙටුම්පත සකස් කර ඇති අතර එහි අන්තර්ගතය කර්තෘ මණ්ඩලයක් මගින් සිදු කර ඇත. මෙම වසරේදී පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ශක්තිමත් කිරීම යටතේ පාසල් ළමා ආරක්ෂක කමිටු 646 ක් පිහිටුවා ඇත. පාසල් වැඩසටහන් 106 පවත්වා ඇත.





## ''ජනපවුර'' ප්‍රජා පාදක ළමා ආරක්ෂක වැඩසටහන

මෙම වැඩසටහන සිදු කරනු ලබන්නේ ග්‍රාමීය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමෙන් ය. මෙමගින් ළමා ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම සඳහා බලපෑම් කළ හැකි ස්වේච්ඡා මහජන නියෝජිතයන් කණ්ඩායමක් ඇති කිරීම සිදු කරයි. මෙහි අපේක්ෂි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ළමුන් පිළිබඳව සියළු තොරතුරු අඩංගු ජාතික දත්ත පද්ධතියක් ගොඩනගා ස්ථාපිත කිරීම, ගම් මට්ටමින් අපයෝජන වැළැක්වීමේ යාන්ත්‍රණයක් ගොඩනැගීම, විදේශගත වූ දෙමාපියන්ගේ ළමුන් ආරක්ෂා කිරීම සහ එක් එක් ළමයා පිළිබඳ සිද්ධි අධ්‍යනයක් සිදු කර ළමුන් පාසල් නොයාම සම්බන්ධයෙන් සාධක සොයා ගැනීම තුළින් ළමයාගේ විශේෂතා සැලකිල්ලට ගනිමින් ළමුන්ගේ අනාගත සුරක්ෂිතතාවය වෙනුවෙන් විසඳුම් ලබාදීම, ළමුන් පාසල්ගත කිරීම සහ පාසල්ගත කළ නොහැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාදීමය. මෙම ළමුන්ගේ ස්වාභාවික හෝ නිත්‍යානුකූල භාරකරුවන් දැනුවත් කිරීම. පාසල්ගත කරන ලද සහ වෘත්තීය පුහුණුව ලබාදුන් ළමුන් පිළිබඳව පසුවිපරම් ක්‍රියාවලිය උදෙසා ප්‍රායෝගික වැඩපිළිවෙළක් දියත් කිරීම, ළමා ආරක්ෂක වැඩසටහන් ගම්

මට්ටමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ජාතික මට්ටමින් ඒ ඒ ප්‍රදේශවල ළමුන්ගේ සහ වින්දිත ළමුන්ගේ යහපැවැත්ම උදෙසා රජය විසින් ගතයුතු පියවර, නීති සංශෝධන සහ ප්‍රතිපත්ති ආදිය පිළිබඳව රජයට කරුණු ඉදිරිපත් කිරීමට ගම් මට්ටමේ සිට තොරතුරු ගලා ඒමේ යාන්ත්‍රණයක් සකස් කිරීමයි.

2019.07.01 දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 ම ආවරණය වන පරිදි ග්‍රාමසේවා වසම් 694 ක ජන පවුර සාමාජිකයන් 4,177 කගේ සහභාගිත්වයෙන් ඉතාමත් ම සාර්ථකත්වයෙන් පවත්වන ලදි. මෙම වැඩසටහනට සමගාමීව පාසල් 555 ක් ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් බිත්ති පින්තාරු කිරීම විශේෂයෙන් ළමා ආරක්ෂාව හා සංවර්ධනය අධ්‍යාපනය ලැබීමේ වටිනාකම, ළමුන්ට සිදුවන මානසික සහ ශාරීරික හිංසන අවම කිරීම සම්බන්ධයෙන් නිර්මාණය කළ වැකි සෑම පාසලකම තාප්පයේ හෝ තෝරාගන්නා ලද පාසල් බිත්තිවල ළමුන් විසින් නිර්මාණ සිදු කිරීම සඳහා ප්‍රතිපාදන යොමු කොට ඇත.






## වැව්ලි ක්ෂේත්‍රය ආශ්‍රිත ළමුන් සහ ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වතු ආශ්‍රිත ජීවත් වනළමුන්ගේ සහ ප්‍රජාවගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ වතු ආශ්‍රිතව වෙසෙන පවුල් ළමා සුරක්ෂිත පවුල් බවට පත්කරමින් ඒවායෙහි ජීවත් වන ළමුන් සතුටින් ජීවත් වන පිරිසක් බවට පත් කිරීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හි නිරතවන නිලධාරීන් පිරිසක් එකී වතු ආශ්‍රිතව බිහි කරලීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හි නිරත වන පිරිසක්, වතු අංශයේ බිහි කිරීමයි. 2019 වර්ෂයේදී ගාල්ල, මාතර,මහනුවර,නුවරඑළිය මාතලේ, රත්නපුර,කෑගල්ල, කුරුණෑගල, බදුල්ල, මොණරාගල සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හී වතු ආශ්‍රිතව වැඩසටහන් 74 ක් පවත්වා ඇති අතර, එමගින් ප්‍රතිලාභය ලැබූ ප්‍රමාණය 2,895 කි.

## ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය ආශ්‍රිත ළමා ආරක්ෂක ව්‍යාපෘතිය (සියපත් සුරැකුම්)

වෙරළබඩ කලාපය ආශ්‍රිතව ජීවත් වන ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහනකි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ වෙරළබඩ කලාපය තුළළමා ආරක්ෂාව සඳහා පවතින අභියෝග හඳුනා ගැනීම, ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ග්‍රාමීය මට්ටමෙන් අවදි කණ්ඩායම් නිර්මාණය කිරීම, ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය යටතේ ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පවත්නා ගැටළු අවම කිරීමට කටයුතු කිරීම සහ ළමුන් සඳහා සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම යි. 2019 වසරේ දිස්ත්‍රික්ක 13 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, ඒ අතරින් ඉදිරිපත් කරන ලද ප්‍රජා ව්‍යාපෘතීන් 07ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ යටතේ විශේෂ මනෝ සමාජීය හා ළමා ආරක්ෂණ වැඩසටහන් 44ක් පවත්වා ඇත.









## අඩු වයස් ගැබ්ගැනීම් වැළැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අඩු වයස් ගැබ් ගැනීම් වළක්වා ගැනීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මෙමගින් අපේක්ෂිත අරමුණ වන්නේ  අඩු වයස් ගැබ් ගැනීම්වලට අවධානම සහිත ළමුන් එයින් මුදවා ගැනීම උදෙසා ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම සහ අධ්‍යාපනයට යොමු කිරීමයි.2019 වසරේදී වැඩසටහන් 24ක් සිදු කර ඇත.

## ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් පාසල් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2019 වසරේ දී ආරම්භ කරන ලදී. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ප්‍රාථමික ගුරුවරුන් තුළ ධනාත්මක ශික්ෂණ ක්‍රියාමාර්ගයන් පිළිබඳව අවබෝධයක් ඇති කිරීම, පාසල් තුළින් කායික දණ්ඩනය බැහැර කිරීම සහ ළමා හිතකාමී, සුරක්ෂිත පාසල් පරිසරයක් නිර්මාණය කිරීම හරහා ළමුන් තුළ පාසල් පැමිණීමට අභිප්‍රේරණයක් ඇති කිරීමටයි.2019 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 34ක වැඩසටහන් 35 ක් පවත්වන ලද අතර, ඒ යටතේ ප්‍රාථමික ගුරුවරුන් 2,347 පුහුණු කරන ලදී.





## දෙමාපියන් හා ගුරුවරුන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ අත්පොත (ශික්ෂා)

දෙමාපියන් ගේ හා ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය ඒකකය විසින් මෙම අත්පොත සකස් කර අවසන් කර ඇත. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ධනාත්මක ශික්ෂණ ක්‍රියාමාර්ගයන් පිළිබඳව අවබෝධයක් දෙමාපියන්, ගුරුවරුන් සහ සමස්ත ප්‍රජාව සඳහා ලබාදීම, අනාගතයේ දෙමාපියන් හා ගුරුවරුන් වීමට අපේක්ෂිත පාර්ශවයන් සඳහා අවශ්‍ය දැනුවත් කිරීම හා මඟ පෙන්වීමක් ලබාදීම, ශ්‍රී ලංකාවේ ළමයින් සියල්ල මානසික හා කායික පීඩාවන්ගෙන් මුදවා ගැනීම සහ යහපත් කායික, මානසික සෞඛ්‍යය මෙන්ම ආත්ම විශ්වාසයක්, ස්වයං විනයක් සහිත සාරධර්මවලින් හෙබි සදාචාර සම්පන්න ළමුන් පිරිසක් බිහි කිරීමයි. 2019 වර්ෂයේ දී මෙම අත්පොත මුද්‍රණය කරන ලදී.








## ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා අධ්‍යාපන කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන.

ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා අධ්‍යාපන කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ළමා ආරක්ෂාව සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ආකල්ප, දැනුම, කුසලතා ගුරුවරුන් හා අධ්‍යාපන කාර්යය මණ්ඩල සාමාජිකයන් වෙත ලබාදීම තුළින් ළමා ආරක්ෂාව සම්බන්ධ සවිබල ගැන්වීම හා සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහිකිරීම, අවධානම් සහගත ළමුන් කල්තියා හඳුනාගෙන ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම තුළින් වඩාත් ඵලදායී ලෙස එකී තත්ත්වයන් කළමණාකරණය කර ගැනීමට මඟ පෙන්වීම සහ අපයෝජනයට ලක් වූ ළමයෙකු සම්බන්ධයෙන් ගත යුතු වඩාත් උචිතම පියවර සම්බන්ධයෙන් මෙම වෘත්තිකයන් දැනුවත් කිරීම තුළින් ළමයාගේ උපරිම යහපත සැලසෙන පරිදි එම

ගැටළු කළමණාකරණය කර ගැනීම මෙන්ම අවශ්‍ය සම්බන්ධීකරණය කරමින් නිසි පරිදි සිදු කිරීමයි. 2019 වසරේදී වැඩසටහන් 08ක් සිදු කර ඇත. ප්‍රතිලාභීන් 2,099 දෙනෙකි.

## විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට දැනුවත් කිරීම සඳහා වඩසටහනක් 2019 වසරේ ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනින් අපේක්ෂිත අරමුණු වන්නේ වැඩසටහනට සහභාගී වන පාසල් ළමා අපයෝජනවලින් ව්‍යුක්ත කලාප බවට පත් කිරීම, පාසල ළමා හිතකාමී පරිසරයක් බවට පත් කිරීම, ළමා අපයෝජන හේතු කොට වින්දිත, අනාරක්ෂිත ළමයින් හඳුනාගැනීම සහ පහසුකරණය සිදු කිරීම සහ ළමා සහභාගීත්වය වර්ධනය කිරීම.2019 වසරේදී වැඩසටහන් 20ක් සිදු කර ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,106 දෙනෙකි.




## ළමා ආරක්ෂාව පිළිබඳව පොලිස් අභ්‍යාස විද්‍යාලවල නිලධාරීන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස් අභ්‍යාස විද්‍යාලවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ, ළමා ආරක්ෂාව පිළිබඳව පොලිස් නිළධාරීන් වෙත දැනුම, ආකල්ප සහ කුසලතා ලබාදීම, ළමා ආරක්ෂාවට අදාළ නීතිය පිළිබඳ දැනුම ලබාදීම තුළින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම සඳහා පොලිස් නිළධාරීන් දිරි ගැන්වීම සහ අවදානම් තත්ත්වයක පසුවන ළමුන් කල්තියා හඳුනාගැනීම තුළින් වඩාත් ඵලදායී ලෙස එම තත්ත්වයන් කළමණාකරණය කර ගැනීමට මගපෙන්වීම යි. 2019 වසරේ වැඩසටහන් 02ක් සිදු කර ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳ සෞඛ්‍ය වෘත්තිකයන් හා ස්වෙච්ඡා සෞඛ්‍ය සේවකයන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් හා ස්වෙච්ඡා සෞඛ්‍ය සේවකයන් දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සේවයේ නියුක්ත පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, පවුල් සෞඛ්‍යසේවා නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා ස්වෙච්ඡා සෞඛ්‍ය සේවකයන් ළමුන් සම්බන්ධයෙන් සංවේදී වෘත්තිකයන් පිරිසක් බවට පත් කිරීම මඟින් ළමුන් සම්බන්ධ සියලු මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත

අරමුණුකොට සිදු කිරීම, ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රජා මට්ටමින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම උදෙසා මෙම වෘත්තිකයන් දිරි ගැන්වීම, රාජ්‍ය නිලධාරියෙකු මෙන්ම ප්‍රජා සාමාජිකයෙකු ලෙස ළමා අපයෝජනයකදී හෝ එවැනි අවදානම් තත්ත්වයකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් නිසි දැනුම හා කුසලතා ලබාදීම, එම නිලධාරීන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ පවත්වන සබඳතාවය ශක්තිමත් කිරීම තුළින් ළමුන් සම්බන්ධ සිද්ධි සඳහා ප්‍රමුඛතාවයකින් සෞඛ්‍ය සේවා සහය ලබා ගැනීමත්ය. ඒ අනුව 2019 වසරේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 27 ක් සිදු කර ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,770 කි.

## ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමා ආරක්ෂාව පිළිබඳ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ළමා ආරක්ෂාව සම්බන්ධ සංවේදී වෛද්‍ය වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම.වෛද්‍ය වෘත්තිකයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග පවත්වන සබඳතාවය ශක්තිමත් කිරීම තුළින් ළමුන්ට සිදුවන අපයෝජන අවම කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාගැනීම යි.2019 වසරේ ජූනි මස මෙම වැඩසටහන පැවැත්වූ අතර, මේ සඳහා වෛද්‍යවරුන් 72 දෙදෙනෙකු සහභාගි විය.

## ළමා සංවර්ධන මධ්‍යස්ථානවල (ළමා නිවාස) පාලන අධිකාරිය සහ කාර්යමණ්ඩලය සඳහා පුහුණුව

ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පාලන අධිකාරිය සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ළමා හිතකාමී හා සුරක්ෂිත ස්ථාන බවට පත් කිරීම, ආයතනගත ළමුන්ගේ යහපැවැත්ම සංවර්ධනය උදෙසා නිවාස පාලක පාලිකාවන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම හා ළමුන්ගේ මනෝසමාජීය යහපැවැත්ම දියුණු කිරීමයි. 2019 වර්ෂයේදි දිස්ත්‍රික්ක 25 තුළ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල ළමයින් සහ කාර්ය මණ්ඩලය සඳහා මනෝසමාජීය පුහුණුව

රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල ළමයින් සහ කාර්ය මණ්ඩලය සඳහා මනෝසමාජීය පුහුණුව ලබාදීම සඳහා මෙම වැඩසටහන 2019 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ රැඳවුම් නිවාසගත ළමුන් පදනම් කරගනිමින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේනතුවට අයත් ළමා රැඳවුම් මධ්‍යස්ථාන සහ සහතික කළ පාසල්වල නේවාසිකව සිටින ළමුන්ගේ මානසික සුව සහනය උදෙසා මනෝසමාජීය මැදිහත්කරණය සහ කළමණාකරණය සිදු කිරීම, මෙම ළමුන්ගේ නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම, ළමුන්ගේ පෞරුෂ සංවර්ධනය සිදු කිරීම

සහ සහතික කළ පාසල් සහ ළමා රැඳවුම් නිවාසවල සේවය කරන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම ආකල්ප කුසලතා සංවර්ධනය කිරීමයි. 2019 වසරේදී වැඩසටහන් 06ක් සිදු කර ඇත.

## පාසල් උපදේශන ගුරුවරුන් සඳහා මනෝසමාජීය පුහුණුව

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරුන් සඳහා මනෝසමාජීය දැනුවත් කිරීමේ මෙම වැඩසටහන 2019 වර්ෂයේ ආරම්භ කරන ලදී. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ළමා ආරක්ෂාවට අදාළව ළමයින් වෙත මනෝ සමාජීය සහයෝගය ලබා දීම හා උපදේශනය ලබාදීම සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම, පාසල තුළදී ළමයින් අපයෝජනයට පත්වීම හෝ පත්විය හැකි අවස්ථා අවම කිරීම උදෙසා අවශ්‍ය මනෝසමාජීය මැදිහත් කරන කුසලතාවන් හා එම හැකියාවන් ප්‍රායෝගිකකරණය පිළිබඳ පාසල් උපදේශන ගුරුවරුන් දැනුවත් කිරීම, පාසල තුළදී ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් උපදේශන ගුරුවරුන්ගේ භූමිකාව තවදුරටත් ශක්තිමත් කිරීම හා ඵලදායී තත්ත්වයට පත් කිරීම සහ ළමා ආරක්ෂාවට හා ළමා අයිතිවාසිකම් තහවුරු කෙරෙන සුරක්ෂිත ළමා හිතකාමී පරිසරයක් පාසල තුළ ඇති කිරීමයි.2019 වසරේ බස්නාහිර සහ වයඹ පළාත් දෙකේ වැඩසටහන් 02ක් සිදු කර ඇත. උපදේශන ගුරුවරුන් 110 දෙනෙකු දැනුවත් කර ඇත.





## විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ තොරතුරු අදාළ තොරතුරු ජනමාධ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වෙමින් ප්‍රජාව අතරට රැගෙන යාමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කටයුතු කරයි. ඒ සඳහා විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍යයයේ සහය ලබා ගැනීමේ ළමා ආරක්ෂාවට අදාළ ප්‍රවෘත්ති නිවේදන ජන මාධ්‍ය වෙත නිකුත් කිරීම හා විෂය කරුණුවලට අදාළව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම සිදු කරයි. මෙමගින් අපේක්ෂිත අරමුණු වන්නේ ළමා ආරක්ෂාව පිළිබඳව ළමුන් දෙමවුපියන් හා වැඩිහිටියන් දැනුවත් කිරීම සහ ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව පිළිබඳ කතිකාවක් නිර්මාණය කිරීමයි.2019 වසරේ රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ගුරුදා පිළිසඳර වැඩසටහන් මාලාවට ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය වැඩසටහන් 05ක් සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග දමිල මාධ්‍ය වැඩසටහන් 02ක් පවත්වන ලදි.

## මුද්‍රිත මෙවලම් නිර්මාණය කිරීම

ළමා අපයෝජනය වළක්වා ගැනීම සඳහා විවිධ තේමාවන් උපයෝගී කර ගනිමින් අත්පත්‍රිකා, පෝස්ටර්, පොත් සහ සඟරා වැනි මුද්‍රිත ප්‍රකාශන සකස් කර මෙමගින් ප්‍රජාව දැනුවත් කර ළමා අපයෝජන අවම කිරීමට දායක කර ගැනීම සිදු කරනු ලබයි.

මෙම වසරේ සිදු කළ විශේෂ කාර්යයක් ලෙස විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා ප්‍රකාශන සකස් කිරීම තොරතුරු හා මාධ්‍ය අංශය විසින් සිදු කරන ලදි. දෘශ්‍යාබාධිත ළමුන් සඳහා බ්‍රේල් ක්‍රමය මගින් අත්පත්‍රිකාවක් සකස් කර බෙදා හරින ලදි. ළමුන්ට එරෙහිව සයිබර් අපරාධ අවම කර ගැනීම සඳහා පත්‍රිකා සකස් කිරීම සිදු කර ඇත.

## ළමා ආරක්ෂාව විෂය පිළිබඳව පාසල් මාධ්‍ය සමාජ වැඩසටහන

අපයෝජනවලින් ළමයින් ආරක්ෂා කර ගැනීමට අදාළ තොරතුරු පාසල් මාධ්‍ය ඒකක හරහා පාසල තුළ ප්‍රචලිත කිරීම මෙහි මූලික අරමුණ වේ. සිසු සිසුවියන්ට අදාළ විෂය පිළිබඳව පුහුණුවක් ලබාදීමද සිදු කරයි. මෙම පාසල් මාධ්‍ය සමාජ මාර්ගෝපදේශ සංග්‍රහය කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සහයෝගය ඇතුව සකසා ඇත. 2019 වසරේ වැඩසටහන් 02ක් සිදු කර ඇත.





## ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනය

ළමා ශ්‍රමිකත්නවයට එරෙහි ජාත්‍යන්තර දිනය මෙම වසරේදී ද සමරන ලදි. "ළමා ශ්‍රමය නිමා කරමු. නැවුම් සිහින සැබෑ කරමු" යන තේමාව මුල් කර ගනිමින් ළමා අපයෝජන හා විවිධ සමාජ, ආර්ථික ගැටළු හේතුවෙන් වින්දිත, ආන්තික හා අනාරක්ෂිත භාවයට පත්වූ ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම,ළමයින් ද්විතීක වින්දිතභාවයට පත්වීම අවම කිරීම හා ළමයා පාසල් හැරයාමේ ප්‍රවණතාවයන් අවම කිරීමේ අරමුණින් මෙදිනට සමගාමීව අධ්‍යාපන ආධාර ලබාදීම සිදු කරන ලදි.2019 වසරේ දිස්ත්‍රික්ක 25න් තෝරාගන්නා ලද ළමුන් 2,115 දෙනෙකු සඳහා අධ්‍යාපන ආධාර ලබා දෙන ලදී.

## ලෝක ළමා දිනය

ලෝක ළමා දිනය සැමරීම මෙම වසරේදී ද සිදු කරන ලදි. මෙවර තේමාව වන්නේ "සුමිතුරු දැයකින් දිනවමු දරුවන්" යන්නයි. ලෝක ළමා දිනයට සමගාමීව දිවයිනේ සියළුම ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආවරණය වන පරිදි පුස්තකාල පොත් කට්ටල බෙදා දීම සිදු කරන ලදි. මෙම වැඩසටහන යටතේ දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුළ පිහිටිළමා සංවර්ධන මධ්‍යස්ථාන 372 ක් සඳහා පුස්තකාල පොත් ලබාදීමට කටයුතු කරන ලදී.

2019.10.01 දින ලෝක ළමා දිනය සමරන දිනයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය විසින් ප්‍රවෘත්ති නිවේදනයක් මගින් ප්‍රජාව දැනුවත් කරන ලදි.

## ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය

ගැහැණු ළමයාගේ ජාත්‍යන්තර දිනය සැමරීමට මෙවර තේමාව වූයේ "ගැහැණු ළමයා ශක්තිමත්ය. ඇය නතර කළ නොහැකිය" යන්නයි. මෙදින ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය විසින් ප්‍රවෘත්ති නිවේදනයක් මගින් ප්‍රජාව දැනුවත් කරන ලදි.

## ප්‍රදර්ශන සහ ජංගම සේවා

ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් අධ්‍යාපනික ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. එම ආයතන මගින් ලැබෙන ඉල්ලීම් අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි පැවැත්වීමට කටයුතු කරයි. 2019 වසරේ ප්‍රදර්ශන 06 කට සහභාගිවී ඇත.





## සුනාමි කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩල

2004 වර්ෂයේ දිවයිනට බලපෑ සුනාමි විපතෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමාපියන් අහිමි වූ වයස අවුරුදු 21 ට අඩු සෑම ළමයෙකුම හා යෞවනයෙකු සම්බන්ධ සුබසාධනය පිළිබඳව මෙහිදී සළකා බලයි. දෙමාපියන් අහිමි හෝ දෙමාපිය දෙදෙනාගෙන් එක් අයෙකු අහිමිව හා ජීවත්ව සිටින මවට හෝ පියාට රැක ගැනීමට හා ආරක්ෂාව සැපයීමට හැකියාවක් නොමැති සෑම ළමයෙකුටම හා යෞවනයෙකුටම 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත මගින් රැකවරණය සලසයි. වින්දිත වූ ළමුන් උදෙසා කැපකරු මාපිය රැකවරණ කටයුතු, පසුවිපරම් කටයුතු හා සුභසාධන කටයුතු සිදු

කෙරේ.මෙහිදී අධ්‍යාපන ආධාර ලබාදීම ද සිදු කරන ලදී.2019 වසරේ මෙම ළමුන් සඳහා කැපකරු මාපිය රැකවරණ ඇගයීම් මණ්ඩල 07ක් පවත්වා ඇත. මේ යටතේ ළමුන් 42 දෙනෙකු සඳහා මාසික අධ්‍යාපන ආධාර ලබාදීම සිදු කරන ලදී.

## මානසික සෞඛ්‍ය ගොඩනැගීම සඳහා සහය ලබාදීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝසමාජීය අංශය වෙත හා දිස්ත්‍රික් සහ ප්‍රදේශීය මට්ටමින් සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන ළමුන් සහ මනෝ සමාජීය සහයන් අපේක්ෂා කරන ළමුන් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරයි. මනෝසමාජීය ඒකකයට සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන ළමුන් සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා පැමිණි ළමුන් සඳහා ද මේ යටතේ පාසල් උපකරණ කට්ටල ලබාදී ඇත. 2019 වසරේ ළමුන් 223 සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදී ඇත. ළමුන් සඳහා උපදේශනය ලබාදීම, වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන් සූදානම් කිරීම සහ මනෝසමාජීය මැදිහත්කරණය ලබාදීම සිදු කරයි.

## වින්දිත, ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජීය සහය ලබාදීම (දිරිය වැඩසටහන)

වින්දිත,ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජීය සහය ලබාදීමේ මෙම වැඩසටහන 2019 වර්ෂයේ ආරම්භ කරන ලදි. මෙමගින් ජාතික ළමා ආරක්ෂිත අධිකාරිය බලාපොරොත්තු වන්නේ වින්දිත,ආන්තික හා අනාරක්ෂිත ළමුන් සඳහා මනෝසමාජීය සහය ලබාදීම තුළින් එම ළමුන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීමයි.2019 වසරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 229 ක ළමුන් 2,294 දෙනෙක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

## ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) නියාමනය කිරීමේ වැඩසටහන

ළමුන්ගේ සුරක්ෂිත බව ඇති කිරීම සඳහා පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වර්තමානය වන විට විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ යමින් එම අරමුණ ඉටු කරමින් සිටී. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ( 14 ග) වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලූ ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන ) අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා නිවාසයන්හි ජීවත්වන ළමුන්ගේ උපරිම යහපත සලසනු වස් 2019 වර්ෂය සඳහා නියමිත ළමා නිවාස අධීක්ෂණය දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී. මෙහි අරමුණු ලෙස, ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන (ළමා සංවර්ධන මධ්‍යස්ථාන) නියාමනය කිරීම හා අදාළ විසඳුම් සෙවීමට සම්බන්ධ සියලූ ආයතන හා එක්ව ඒකාබද්ධ නියාමන ප්‍රවේශයක් යටතේ වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස මෙම කාර්යය සිදු කිරීම, ආයතනගත ළමුන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව තහවුරු වන වඩාත් සුරක්ෂිත ආයතනික පරිසරයක් ඇති කිරීම, හා සේවයේ යෙදෙන පාර්ශවයන්හි දැනුම, කුසලතා

හා ආකල්ප සංවර්ධනය කිරීම යනාදියවේ. මෙම වර්ෂයේදී ළමා සංවර්ධන මධ්‍යස්ථාන 372ක් නියාමනය සඳහා කටයුතු සිදු කර ඇති අතර,ළමුන් 8,500 ක් පමණ ප්‍රතිලාභ ලබාතිබේ.

## ආපදා කළමණාකරණය සම්බන්ධව නිලධාරී පුහුණුව හා ආපදා සහන සේවා

හදිසි ආපදා අවස්ථාවන්වල දී ළමයින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය ලබා දීම තුළින් මෙවැනි තත්ත්වයක දී ළමුන් ආරක්ෂා කර ගැනීම මෙහි අරමුණයි. මෙහිදී දිස්ත්‍රික්, ප්‍රාදේශීය නිලධාරීන් සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් පුහුණු කරයි. 2019 වසරේ වැඩසටහන් 01 ක් සිදු කර ඇත.

## මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

මෙම රැස්වීම් සෑම මසකම දිස්ත්‍රික් නිලධාරීන් විසින් එම දිස්ත්‍රික්කය තුළම සිදු කරයි. දිස්ත්‍රික් නිලධාරින් සහ දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් විසින් සියළුම ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සමග මෙම රැස්වීම පවත්වයි. මෙමගින් අපේක්ෂා කරනුයේ දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය වශයෙන් තම කාර්යයන් විධිමත්ව සහ ඵලදායිව සිදු කර ගැනීමයි. 2019 වසරේ වැඩසටහන් 191 ක් පවත්වා ඇත.

## දිස්ත්‍රික් නිලධාරීන් සඳහා කාර්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

මෙම රැස්වීම් කාර්තුවකට 01 බැගින් සියළුම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරින් සහ සියළුම දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් ප්‍රධාන කාර්යාලයට කැඳවා සිදු කරයි. මෙමගින් අරමුණු වන්නේ මෙම වර්ෂයට අදාළ සංවර්ධන ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය නියාමනය කිරීම, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්ගේ සහ දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්ගේ කාර්ය අධීක්ෂණය සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇති වන බාධා, ගැටළු හා අභියෝග හඳුනා ගැනීමයි. 2019 වසරේ වැඩසටහන් 02ක් පවත්වා ඇත.

## සැලසුම්කරණය, අධීක්ෂණය සහ ඇගයුම් වැඩමුළු

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ක්‍රියාත්මක සංවර්ධන ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය නියාමනය හා ඇගයීම සිදු කරයි. එමගින් අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් වෙත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය සිදු කිරීම සහ වැඩසටහන් සඳහා පෙර ඇගයුම් හා පසු ඇගයුම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරයි. පළාත් 09 නිලධාරීන් එවනු ලබන මාසික වාර්තා තුළින් නියාමනය සහ ඇගයීම මාසිකව සිදු කරනු ලැබේ. 2019 වසරේ වැඩසටහන් 07ක් සිදු කර ඇත.




## වීදි ළමුන් සහ යාචකයන් පිළිබඳ අධ්‍යයනය

වීදි ළමුන් සහ යාචකයන් පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් කාර්යයක් වේ. එය හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම අධ්‍යයනය සිදු කිරීමට මූලික කටයුතු මෙම වසරේදී ආරම්භ කරන ලදි. මෙහිදී දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස්කර ගැනීමට කටයුතු සිදු කර ඇත.

## දිස්ත්‍රික් පාර්ශවකරුවන්ගේ රැස්වීම්

මෙම වැඩසටහන මගින් දිස්ත්‍රික් වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධීකරණය සිදු කරයි. 2019 වර්ෂයේ ආරම්භ කරන ලද නව වැඩසටහනකි. මෙමගින් අරමුණු වන්නේ රාජ්‍ය නොවන ආයතන සමග මනා ලෙස සම්බන්ධීකරණය වෙමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පනත ප්‍රකාරව ළමයින් සඳහා උපරිම යහපත උදාකරදීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජාපාදක සංවිධාන අතර සහයෝගිතා වර්ධනය කර ගැනීමයි.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ තොරතුරු වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය www.childprotection.gov.lk සහ තොරතුරු වෙබ් අඩවිය www.youthink.lkනමින් ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු ඇතුළත් වෙබ් අඩවි සංවර්ධනය කිරීම සිදුවේ.

ළමා අපයෝජනවලින් ළමුන් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට සුරක්ෂිත වටපිටාවක් උරුම කර දීමට අදාළ තොරතුරු එම වෙබ් අඩවියට ළමා හිතකාමී ලෙස ඇතුළත් කර ඇත. එම වෙබ් අඩවි යාවත්කාලීන කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ තොරතුරු හා මාධ්‍ය ඒකකය මගින් සිදු කරනු ලබයි. නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතියි.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය සංවර්ධනය කිරීම.

ළමා ආරක්ෂක විෂය ක්ෂේත්‍රයට අදාළව විමර්ශන පුස්තකාලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදි.

විශේෂයෙන් අධිකාරිය වෙත පැමිණෙන පුද්ගලයන් සඳහා ඉතා පහසුවෙන් තොරතුරු ලබා ගැනීමට නව පුස්තකාල පරිශ්‍රයක් සකස් කිරීම සඳහා සැලසුම් කිරීම 2018 වර්ෂයේදී සිදු කරන ලදී. මෙහි දී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය මගින් එම බිම් සැලැස්ම සකස් කළ අතර, ඉදිරි වසරවල දී මෙම පුස්තකාලය පරිශ්‍රය සකස්කිරීමට ද සැලසුම් කර ඇත.

මෙම විමර්ශන පුස්තකාලයේ පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වන්නේ උපරිම ගුණාත්මකභාවයකින් යුතුව තොරතුරු සේවා හා තොරතුරු මූලාශ්‍ර ලබා දෙමින් ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ සඳහා සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණෙන පර්යේෂකයන්ට, නිලධාරීන්ට සහ අධ්‍යාපන ආයතනවල අනිකුත් පුද්ගලයන්ට ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම හා පොත් පරිශීලනය සඳහා අවස්ථාව ලබාදීම මෙන්ම, විද්‍යාර්ථීන්ට සහ පාසල් සිසු දරුදැරියන් වෙත ද තොරතුරු ලබා දීම සිදු කරනු ලබයි.2019 වසරේ කියවීමේ මාසය වෙනුවෙන් අධිකාරියේ නිලධාරීන් සඳහා කියවීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදි.

## ජනමාධ්‍ය සම්බන්ධීකරණය

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14 (ඇ) හා (ජ) වගන්ති ප්‍රකාරව ළමයින්ගේ සුරක්ෂිතතාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීමේ ප්‍රධානතම මාධ්‍ය වන ජනමාධ්‍ය හරහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පණිවුඩ සමාජගත කිරීම සම්බන්ධීකරණය තොරතුරු හා මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව විවිධ තේමා ඔස්සේ 2019 වසරේ ප්‍රවෘත්ති නිවේදන 09ක් නිකුත් කර ඇත.

## ළමා අපයෝජන වින්දිතයන්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තුළ විශේෂ ඒකකයක් ක්‍රියාත්මක වේ. 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව අපයෝජනයට ගොදුරු වී ඇති ළමයෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගතකර එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීම මෙමගින් සිදු කළ හැකිය.ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2019 වසරේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 73 ක් සිදු කරන ලදී. ඉල්ලීම් ලද අධිකරණ සඳහා පටිගත කළ සාක්ෂි පිටපත් 57ක් මුදා හැර ඇත.

## 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව

ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත ප්‍රකාරව "ළමා අපයෝජනය පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම" යන්න වඩාත් ඵලදායී

සහ කාර්යක්ෂමව කිරීම සඳහා 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය 2010 ජූලි 22 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙය ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම හා ඒවාට කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රමුඛතම යාන්ත්‍රණය ද වේ. එමගින් සමාජය තුළ සැඟව තිබූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාවීම් දක්නට ලැබේ.

ගාස්තු අයකිරීමකින් තොරව පැය 24 පුරා ක්‍රියාත්මක වන මෙම සේවාව ඇමතීම මගින්, ඕනෑ ම පුද්ගලයෙකුට ළමයින් සම්බන්ධයෙන් පැන නගින ගැටළු මෙන් ම ළමා අපයෝජන සම්බන්ධයෙන් ද පැමිණිලි කිරීමට හැකියාව පවතියි. මෙමගින් උපදේශන සේවය ලබා ගැනීමට ද අවස්ථාව ලැබේ. මෙම සේවාව මූලිකව ළමුන් සඳහා වෙන්ව ඇතත් ගුරුවරුන්, දෙමව්පියන් සහ ළමා රැකවරණ සපයන්නන් ආදි වැඩිහිටියන්ට ද, ළමුන් පිළිබඳ ඔවුන්ට ඇති ගැටළුළමුන් හදාවඩා ගැනීමේ පරිචයන් ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහාත් භාවිතා කළ හැකිය.2019 වසර තුළ මෙම දුරකථන අංකයට ඇමතුම් 126,095 ක් ලැබී ඇත. මෙම දුරකථන ඇමතුම්වලින් 7,949 ක් පැමිණිලි වශයෙන් ලැබී ඇත

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. එම ක්‍රම පහත සඳහන් කර ඇත.

01. 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය හරහා ලැබෙන පැමිණිලි.
02. අධිකාරියට පැමිණ වාචිකව ඉදිරිපත් කරන පැමිණිලි.
03. ලිපි මගින් ලැබෙන පැමිණිලි.
04. Email හෝ සයිබර් ආවේක්ෂණය මගින් ලැබෙන තොරතුරු.

මෙම ලැබෙන පැමිණිලි සියල්ල කඩිනමින් විභාගයට ගැනෙන අතර, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කිරීමකට ලක් කෙරේ. මෙම වසර තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 8,558 කි.

### 2019 වසර තුළ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව (දිස්ත්‍රික්ක අනුව)

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 1167 |
| 02 | කළුතර | 478 |
| 03 | ගම්පහ | 888 |
| 04 | මහනුවර | 390 |
| 05 | මාතලේ | 140 |
| 06 | නුවරඑළිය | 177 |
| 07 | ගාල්ල | 537 |
| 08 | මාතර | 301 |

| | | |
|---|---|---|
| 09 | හම්බන්තොට | 335 |
| 10 | යාපනය | 175 |
| 11 | මන්නාරම | 80 |
| 12 | වව්නියාව | 106 |
| 13 | මුලතිව් | 122 |
| 14 | කිලිනොච්චි | 141 |
| 15 | මඩකලපුව | 166 |
| 16 | අම්පාර | 201 |
| 17 | ත්‍රිකුණාමලය | 133 |
| 918 | කුරුණෑගල | 726 |
| 19 | පුත්තලම | 375 |
| 20 | අනුරාධපුරය | 487 |
| 21 | පොළොන්නරුව | 229 |
| 22 | බදුල්ල | 224 |
| 23 | මොණරාගල | 221 |
| 24 | රත්නපුර | 471 |
| 25 | කෑගල්ල | 288 |
| | ***මුළු සංඛ්‍යාව*** | **8558** |

## 2019 වසර තුළදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු පැමිණිලි ස්වාභාවය අනුව වර්ගීකරණය

| අනු අංකය | පැමිණිලි ස්වාභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 27. ACO නීත්‍යානුකුල නොවන අයුරින් රඳවා තබා ගැනීම තහනම් කිරීම | 4 |
| 02 | 286A. ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන සහ ප්‍රදර්ශන | 23 |
| 03 | 288.ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම | 299 |
| 04 | 288B. සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | 29 |
| 05 | 308. | 2 |
| 06 | 308A.ළමයින් කෲරත්වයට ලක්කිරීම | 2342 |

| | | |
|---|---|---|
| 07 | ලිංගික අතවර කිරීම | 594 |
| 08 | 35. CYPO – භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් සහ යෞවනයින් | 7 |
| 09 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම | 109 |
| 10 | 352. පැහැරගෙනයාම | 44 |
| 11 | 360B. ළමා ලිංගික සූරාකෑම | 4 |
| 12 | 360C. තැනැත්තන් වෙළඳාම් කිරීම | 119 |
| 13 | 360E. ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 14 |
| 14 | 363. ස්ත්‍රී දූෂණය | 294 |
| 15 | 364A. ව්‍යභිචාරය | 1 |
| 16 | 365. අස්වාභාවික වැරදි | 1 |
| 17 | 365A. තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 1 |
| 18 | 365B. බරපතල ලිංගික අපයෝජනය | 288 |
| 19 | 71.CYPO - නොසළකාහැරීම | 906 |
| 20 | 76. CYPO –දුම්කොල විකිනීම | 1 |
| 21 | ළමා මෙහෙකාර සේවය | 265 |
| 22 | අනිවාර්යය අධ්‍යාපනය | 1290 |
| 23 | ගෘහස්ත ප්‍රචණ්ඩත්වය | **79** |
| 24 | ළමා අපචාර | **337** |
| 25 | වෙනත් | **1505** |
| | ***මුළු සංඛ්‍යාව*** | **8558** |

## නීතිමය කර්තව්‍යයන්

අපයෝජනයට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, ළමා අපයෝජන පිටුදැකීම සඳහා වූ නීතිමය හෝ පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම, නීති උපදෙස් ලබා දීම සහ ළමා අපයෝජන සම්බන්ධ සියලූ විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම හා ඊට අදාළව අධිකරණයෙහි පෙනී සිටීම යනා දී කාර්යයන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි. අධිකාරි පනතට අමතරව පහත පනත්වලට අදාළව ද කටයුතු කරයි.

- 2006 අංක 16 දරණ සුනාමි විශේෂ විධිවිධාන පනත
- 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාත්මක නීති අංශය මගින් 2019 වර්ෂයේදී නීති උපදෙස් ලබාදීම් යටතේ දුරකථන මාර්ගයෙන් 593 ක් සහ සේවාලාභීන් 138 දෙනෙක් අධිකාරියට පැමිණ නීති උපදෙස් ලබා ගන්නා ලදි.එමෙන්ම අධිකරණයේ නඩු සඳහා පෙනීසිටීම් 24 ක් සඳහා සහභාගි වී ඇත. රැස්වීම් 99 කට සහභාගිවී ඇත.

**2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනත අනුව නඩු සංඛ්‍යාව**

| අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 11 |
| මඩකලපුව | 14 |
| කොළඹ | 04 |
| ගාල්ල | 09 |
| හම්බන්තොට | 28 |
| කළුතර | 03 |
| මාතර | 11 |
| ***මුළු සංඛ්‍යාව*** | **80** |

**නීති අංශය අධිකරණය ඉදිරියේ සිදුකල පෙනීසිටීම් සංඛ්‍යාව**

| අනු අංකය | අධිකරණය | නඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රේෂ්ඨාධිකරණය | 02 |
| 02 | බත්තරමුල්ල ළමා අධිකරණය | 09 |
| 03 | ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය | 08 |
| 04 | කුළියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණය | 01 |
| | **මුළු සංඛ්‍යාව** | **20** |

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මගින් මහජනතාවගෙන් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් සිටියි. ඒ සඳහා 24 පැය පුරාවට ම ක්‍රියාත්මක වන පරිදි විශේෂ පොලිස් විමර්ශන ඒකකයෙන් නිලධාරීන් යෙදවීමට කටයුතු කර ඇත.

**2019 වර්ෂයේ දී විශේෂ පොලිස් විමර්ශන ඒකකය මගින් විමර්ශනය සිදු කරන ලද පැමිණිලි සම්බන්ධ වාර්තාව**

| අනු අංකය | වරද | වාර්තා වූ ගණන | විමර්ශනය වන ගණන | විමර්ශනය අවසන් ගණන | අසත්‍ය | අධිකරණයට යොමු කළ ගණන | අධිකරණයේ කැඳවන ගණන | බැහැර පොලිස් ස්ථානවලට විමර්ශන සඳහා යොමු කළ |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | සුළු අපරාධ | 09 | - | 09 | - | 09 | 09 | - |
| 02 | විවිධ පැමිණිලි | - | - | - | - | - | - | - |
| 03 | බල අපරාධ | 36 | - | 36 | 04 | 36 | 36 | - |
| මුළු සංඛ්‍යාව | | 45 | - | 45 | 04 | 45 | 45 | - |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා 2019 වර්ෂය තුළ පැවැත්වූ පුහුණු වැඩමුළු

| | පුහුණු වැඩසටහනේ නම | දිනය | ස්ථානය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු කාලය |
|---|---|---|---|---|---|
| 01 | ධනාත්මක මනෝවිද්‍යාව සහ චිත්ත පීඩා කළමණාකරණය | 2019.11.28 | | 9 | දිනක |
| 02 | රාජ්‍ය අංශයේ කාර්යාල ක්‍රමවේදය පිළිබඳව වැඩමුළුව | 2019.12.09 සහ 2019.12.10 | | 5 | දින දෙකක |
| 03 | ගබඩා කළමනාකරණය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළි බඳ වැඩමුළුව | 2019.11.28 සහ2019.11.29 | | 2 | දින දෙකක |
| 04 | විනය ක්‍රියා පටිපාටිය | 2019.11.25 සහ 2019.11.26 | | 3 | දින දෙකක |
| 05 | කුසලතා ඇගයීම හා කේ.පී.අයි පිළිබඳ දැනුම ලබාදීම | 2019.11.25 | | 2 | දිනක |
| 06 | තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන කළමණාකරණ වැඩමුළුව | 2019.12.09 සහ 2019.12.10 | | 1 | දින දෙකක |
| 07 | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ දෙදින වැඩමුළුව | 2019.12.09 සහ 2019.12.10 | | 1 | දින දෙකක |
| 08 | පාරිභෝගික සේවා පිළිබඳ දෙදින වැඩමුළුව | 2019.11.21 සහ 2019.11.22 | | 1 | දින දෙකක |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09 | ඵලදායී ඉදිරිපත් කිරීමේ කුසලතා | 2019.11.21 සහ 2019.11.22 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 11 | දින දෙකක |
| 10 | කළමණාකරණ සහයක සඳහා තොරතුරු තාක්ෂණය | 2019.12.05 සහ 2019.12.06 | | 4 | දින දෙකක |
| 11 | පරිගණක ජාලකරණයෙහි මූලිකාංග | 2019.12.16, 2019.12.17 සහ 2019.12.18 | | 2 | දින තුනක |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | | ( රුපියල් ) |
|---|---|---|---|
| **විස්තරය** | **සටහන්** | **2019** | **2018** |
| **වත්කම්** | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 67,929,606.03 | 86,302,081.19 |
| නොනිමි වැඩ වව්නියා ගොඩනැගිල්ල සැකසීම | | 3,982,463.55 | 3,026,148.14 |
| කල්බදු ඉඩම් | | 20,928,865.41 | 21,707,906.51 |
| ආයෝජන හා ඉතිරිකිරීම් | 9 | 7,694,089.44 | 7,982,626.65 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 10 | 131,147.25 | 501,043.36 |
| | | **100,666,171.68** | **119,519,805.85** |
| ***ජංගම වත්කම්*** | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 364,096.06 | 487,502.77 |
| ආපදා ණය නැවත ගෙවීම් | | 470,734.14 | 470,734.14 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 8,889,325.37 | 21,053,750.23 |
| ඉදිරියට කළ ගෙවීම් | 12 | 639,557.47 | 666,726.54 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 5,250,317.18 | 3,387,629.91 |
| | | **15,614,030.22** | **26,066,343.59** |
| **මුළු වත්කම්** | | **116,280,201.90** | **145,586,149.44** |
| **වගකීම්** | | | |
| ***ජංගම නොවන වගකීම්*** | | | |
| පාරිතෝෂික වෙන්කිරීම | | 44,749,353.50 | 35,394,403.00 |
| ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය හෝ /(ඌනතාවය) | 14-A | 2,720,160.33 | 1,601,668.55 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 14-B | 584,997.27 | (321,549.73) |
| | | **48,054,511.10** | **36,674,521.82** |
| ***ජංගම වගකීම්*** | | | |
| උපචිත වියදම් | 15 | 5,876,289.91 | 18,672,035.08 |
| කෙටිකාලීන වෙන්කිරීම් | 16 | 916,094.14 | 1,782,034.14 |
| | | **6,792,384.05** | **20,454,069.22** |

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

( රුපියල් )

| විස්තරය | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| ***ආදායම*** | | | |
| පුනරාවර්තන ප්‍රදාන -මහාභාණ්ඩාගාරය | | 257,512,685.29 | 236,480,000.00 |
| - අනෙකුත් ආයතන | 1A | - | 68,494.88 |
| - අනෙකුත් ආදායම් | 1B | 24,027,617.79 | 23,503,171.77 |
| ජාතික ක්‍රියාකාරි සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 54,449,445.60 | 45,078,475.70 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1C | - | 1,000.00 |
| **මුළු ආදායම** | | **335,989,748.68** | **305,131,142.35** |
| ***වියදම්*** | | | |
| පරිපාලන වියදම් | 2 | 234,119,826.14 | 218,712,109.88 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 98,969,835.79 | 93,776,458.60 |
| ව්‍යාපෘති වියදම් | 4 | - | 68,494.88 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | - | - |
| මුල්‍ය වියදම් | 6 | - | 12,967.08 |
| **මුළු වියදම්** | | **333,089,661.93** | **312,570,030.44** |
| **කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)** | 7 | **2,900,086.75** | **(7,438,888.09)** |

| | | | |
|---|---|---|---|
| **මුළු වගකීම්** | | **54,846,895.15** | **57,128,591.04** |

| | | | |
|---|---|---|---|
| ***ශුද්ධ වත්කම්*** | | **61,433,306.75** | **88,457,558.40** |
| ***මුලධනය වත්නේ*** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 17 | 40,929,636.38 | 61,247,752.69 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1,941,600.05 | 1,930,000.00 |
| රඳවාගත් ඉපැයුම් | | 18,562,070.32 | 25,279,805.71 |
| | | **61,433,306.75** | **88,457,558.40** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රුපියල් වලින්)

| විස්තර තොරතුරු | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය) | | 2,900,086.75 | (7,438,888.09) |
| **පෙර වසරේ ගැලපුම්** | | | |
| **පාරිතෝෂික වෙන්කිරීම්** | | - | 17,779,419.00 |
| **ප්‍රාග්ධන ප්‍රදානයන් -කල් බදු ඉඩම්** | | - | 17,096,573.27 |
| රඳවාගත් ඉපැයීම් | | (9,617,822.14) | (39,195,626.39) |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | | 906,547.00 | |
| මුදල් නොවන සංචලනයන් | | | |
| ක්ෂයවීම් | 8 | 21,123,948.16 | 21,432,928.78 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | | 779,041.10 | 779,041.10 |
| ක්‍රමක්ෂය වූ සුනාමි ප්‍රදාන | | - | - |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | (20,683,630.31) | (21,246,969.88) |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | 1,118,491.78 | 9,555.12 |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන සංචිතය | | - | - |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | 11,600.05 | (965,000.00) |
| ප්‍රාග්ධන ප්‍රදාන - උපකරණ | | - | - |
| රඳවාගත් ඉපැයීම් වල වැඩිවීම්/(අඩුවීම්) | | - | - |
| ගෙවියයුතු ගිණුම්වල වැඩිවීම්/(අඩුවීම්) | | (12,795,745.17) | 7,427,925.10 |
| කෙටිකාලීන වෙන්කිරීම් වැඩිවීම්/(අඩුවීම්) | | (865,940.00) | 740,184.00 |
| තොග වැඩිවීම්/(අඩුවීම්) | | 123,406.71 | (27,582.96) |
| ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම්/(අඩුවීම්) | | 12,164,424.86 | 3,081,518.08 |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/(අඩුවීම්) | | 27,169.07 | (59,164.54) |
| පාරිතෝෂික දායකය | | 10,067,119.50 | 6,137,143.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,258,697.36** | **5,551,055.59** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (2,751,473.00) | (4,358,002.89) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම | | - | 7,527.96 |

| | | | |
|---|---|---|---|
| ඉඩම බදු ගැනීම | | - | - |
| නොනිම් වැඩ වර්නියා ගොඩනැගිල්ල සැකසීම | | (956,315.41) | (3,026,148.14) |
| දිගුකාලීන ලැබිය යුතු ගිණුම් වල (වැඩිවීම්/අඩුවීම්) | | 369,896.11 | 519,736.63 |
| ආයෝජන ප්‍රතිලාභ | | 288,537.21 | 57,722.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(3,049,355.09)** | **(6,799,164.44)** |
| **<u>මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| පාරිතෝෂික ගෙවීම | | (712,169.00) | (372,404.00) |
| සීමිත අරමුදල් වල වැඩිවීම් / (අඩුවීම්) | | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 365,514.00 | 751,412.77 |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(346,655.00)** | **379,008.77** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම් | | **1,862,687.27** | **(869,100.08)** |
| ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | **3,387,629.91** | **4,256,729.99** |
| **මුදල් සහ මුදල්වලට සමාන දෑ** | **13** | **5,250,317.18** | **3,387,629.91** |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(රුපියල්)

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය | **81,743,309.80** | **2,895,000.00** | **32,719,693.80** | **117,358,003.60** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | (7,439,888.09) | (7,439,888.09) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20,495,557.11) | (965,000.00) | - | (21,460,557.11) |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | **61,247,752.69** | **1,930,000.00** | **25,279,805.71** | **88,457,558.40** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම | - | - | (9,617,822.14) | (9,617,822.14) |
| **2019 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **61,247,752.69** | **1,930,000.00** | **15,661,983.57** | **78,839,736.26** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | 2,900,086.75 | 2,900,086.75 |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (20,318,116.31) | 11,600.05 | - | (20,306,516.26) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **40,929,636.38** | **1,941,600.05** | **18,562,070.32** | **61,433,306.75** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඩීටීවයි/සී/එන්සීපීඒ/2019/01/14

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2020 අගෝස්තු 14 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත්, ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් දිගුකාලයකට සිට පැවති ව්‍යාපෘති අරමුදල් තුනක එකතුව රු.602,509 ක් වූ හර ශේෂ සහ අරමුදල් හයක එකතුව රු.3,322,669 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමකින් තොරව එකිනෙකට හිලව් කර රු.2,720,160 ක් වූ ශුද්ධ බැර ශේෂය මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.11,192,030 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු එකතුව රු.1,502,528 ක් වූ පාරිතෝෂික ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

(ඈ) 2018 හා 2019 වර්ෂවල දී අධිකාරිය ඉදිරිපිට පැවති පැරණි මායිම් තාප්පය වෙනුවට නව මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා වැය කර තිබුණු එකතුව රු.3,635,654 ක පිරිවැය ප්‍රාග්ධනීත කිරීම වෙනුවට අයහාර වියදම් ලෙස ආදායමට ලියා හැර තිබුණු අතර මෙ සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණු රු.1,741,535 ක මුදල වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම පැරණි මායිම් තාප්පයේ වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ ආපදා ණය නැවත ගෙවීම් ලෙස රු.470,734 ක් දක්වා තිබූ අතර, එම වටිනාකම වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන අතර, එම ශේෂය සනාථ කර ගැනීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.1,230,959 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම ලෙස දෝෂ සහගත ලෙස දක්වා තිබූ අතරම, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් නොවන ගැලපීම් යටතේ ද ගලපා තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වා ගෙන ගොස් ඇති බව,
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව,

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

-

| | බලතල, කර්තව්‍යය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|---|
| | --------------------- | ------------ |
| | 1998 අංක 58 දරන ජාතික ළමා ආරක්ෂක පනත | |
| (අ) | පනතේ 14 (උ) සහ (ඌ) වගන්ති ප්‍රකාරව සියලු ආකාර ළමා අපචාරවලට අදාල නීති ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම හා ළමා අපචාර සම්බන්ධ සියළු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීමට පියවර ගැනීම. | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් අංශය වෙත 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලි 48,361 න් පැමිණිලි 413 ක් විමර්ශනය අවසන් කර මහාධිකරණය වෙත අධිචෝදනා ගොනු කිරීම සඳහා නීතිපති වෙත යොමු කර තිබුණ ගොනු 228 ක් සඳහා මහාධිකරණයේ නඩු පවරා නොතිබුණි. |
| (ආ) | පනතේ 14 (ඒ) වගන්තිය ප්‍රකාරව අපරාධ පිළිබඳ විමර්ශනවලට හා අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම | ළමා අපයෝජනයන්ට ගොදුරු වූ වින්දිත ළමුන් සඳහා පහසුකම් සැලසීමට රු.250,000 ක් සහ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.1,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් පිළිවෙලින් රු. 51,000 ක් හා රු. 27,000 ක් පමණක් වැය කර තිබුණි.<br><br>2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ඉල්ලීම් 461 ක් ලැබී තිබුණු අතර, ඉන් 331 ක් පමණක් පටිගත කර තිබුණි. එම කාර්යය සඳහා එක් නිලධාරියෙකු පමණක් සේවය කරන අතර පටිගත කිරීම් සම්බන්ධව සාක්ෂි දීමට මහාධිකරණයට සහභාගි වීමට සිදු වීම මෙම ප්‍රමාදයට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඈ) | පනතේ 14 (ක) වගන්තිය ප්‍රකාරව ළමා අපචාර සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම හා එය පවත්වාගෙන යාම. | 2014 වර්ෂයේ සිට අධිකාරියේ පැමිණිලි විසඳීමෙ දත්ත පදනමක් සකස් කිරීම ආරම්භ කර තිබුණ ද පනතේ අරමුණු වලට අනුව එම දත්ත පද්ධතිය විගණිත දිනය වූ 2020 ජූනි 30 දින දක්වාම නිම කර නොතිබුණි. |
| (ඇ) | පනතේ 14 (ඔ) වගන්තිය ප්‍රකාරව ළමා අපචාර පිළිබඳ මහජන පැමිණිලි භාරගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී එම පැමිණිලි නිසි නිලධාරීන් වෙත යොමු කිරිම. | පැමිණිලි විසඳීමෙ දුර්වලතාවයන් හේතුවෙන් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී තිබුණු පැමිණිලි 81,259 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැමිණිලි 41,142 ක් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ අතර, එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. |
| (ඉ) | පනතේ 14 වගන්තියේ (ජ) ප්‍රකාරව ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම. | මේ සම්බන්ධව ප්‍රමාණවත් කාර්යයන් ඉටුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා වෙන් කරන ලද රු. 6,577,000 ක මුදල අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ග්‍රාමීය සිවිල් සමාජ ක්‍රියාකාරීන් හඳුනා ගැනීම සඳහා පමණක් වැය කර තිබුණි. |
| (ඊ) | පනතේ 16, 17 වගන්ති ප්‍රකාරව අධිකාරියේ මූල මණ්ඩලයක් විය යුතුය. මූල මණ්ඩලයේ නිලධරයන් අධිකාරියේ සියළු රැස්වීම්වලට සහභාගී විය යුතු අතර, අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරිම සඳහා අධිකාරියට සහාය වීම. | අධිකාරියේ කාර්යයන් වලට සක්‍රීය දායකත්වයක් දක්වා ඒ අනුව අධිකාරියේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මූල මණ්ඩලයේ නිලධාරීන් කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තිය සඳහා අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) අධිකාරියට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේ කල්බදු පදනම යටතේ ලබා ගත් කල්බදු වටිනාකම රු. 18,317,757 ක් වූ ඉඩම 2020 ජූනි 30 වන දින වන විටත් අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සමාජ ආරක්ෂණ ක්‍රියාකාරි සැලසුම් ක්‍රියාත්මක කිරිම සඳහා ලබා දී තිබුණු රු. 8,075,000 ක ප්‍රතිපාදනවලින් රු. 1,975,000 ක් ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික මාර්ගෝපදේශය සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම සඳහා වැඩසටහන් 25 ක් පැවැත්වීමට වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.478,000 ක් වැය කර දිස්ත්‍රික්ක 7 ක නිලධාරීන් 415 දෙනෙකු සඳහා වැඩසටහන් 7 ක් පමණක් පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ මුළු ප්‍රතිපාදනවලින් රු. 4,805,000 ක් එනම්, සියයට 59 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) 24 පැය නොමිලේ ළමා දුරකතන සේවය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා රු. 4,250,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර, එයින් රු. 2,900,000 කින් කළයුතුව තිබූ කාර්යයන්ගෙන්, සර්වර් කාමරය ස්ථාපිත කිරීම, නිලධාරීන් සඳහා රාක්ක තැනීම හා 1929 ඇමතුම් මධ්‍යස්ථානය සඳහා පුටු මිලදී ගැනීමේ කාර්යයන් ඉටු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර, ශ්‍රී ලංකාව.

தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
இல.330, தலவதுகொட வீதி, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர, இலங்கை.

**National Child Protection Authority**
No. 330, Thalawathugoda Road, Madiwela, Sri Jayawardenapura, Sri Lanka.

දුරකථන / தொலைபேசி இல / Telephone : 011 2778911 -12-14
ෆැක්ස් / தொலைநகல் / Fax : 011 2778915
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / Email : chairman@childprotection.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web : www.childprotection.gov.lk